**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව , තැ.පෙ.14, පේරාදෙණිය**

தேசிய தாவரவியல் பூங்காக்கள் திணைக்களம் ,த.பெ.14,  பேராதனை.

Department of National Botanic Gardens,P.O.Box.14,Peradeniya

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2018
## வருடாந்த முன்னேற்ற அறிக்கை - 2018
# Annual Performance Report -2018

**සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**
**சுற்றுலா அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் கிறித்தவ சமய அலுவல்கள் அமைச்சு**
**Ministry of Tourism Development, Wildlife and Christian Religious Affairs**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2018

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
තැ.පෙ.**14**, පේරාදෙණිය

# පටුන


1. හැඳින්වීම 04

2. 2018 වසරේදී ලැබූ ප්‍රගතිය 09

3. ආදායම 10

4. මූල්‍ය වැය ප්‍රගතිය 11

5. 2018 වර්ෂයේ උද්භිද උද්‍යානයන් හි සිදු වූ සංවර්ධන වැඩසටහන් 14

6. 2018 වර්ෂය තුල තනතුරු ඇති කිරීම්, බඳවා ගැනීම්, ස්ථාන මාරු, මුදා හැරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යාම් 34

7. කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියාව ගොඩනැංවීම 37

8. 2019 වර්ෂය සඳහා ක්‍රියාත්මක සැලැස්ම 39

# කාර්ය සාධන වාර්තාව 2018

## 1.හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුරෝගාමී ආයතනය වේ. මෙය ශාක විතැන් සංරක්ෂණය, ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු, ශ්‍රී ලංකාවේ උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය සඳහා පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන්, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදෙන අතර දෙස් විදෙස් සංචාරකයින් ගේ ආකර්ෂණීය ස්ථානයක් ද වේ.

ප්‍රධාන උද්භිද උද්‍යාන වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ පිහිටි හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට අමතරව මෑත කාලයේදී පිළිවෙළින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු වන උද්භිද උද්‍යාන තුළ ශාක විශේෂ 4500 කට අධික ප්‍රමාණයක් සංරක්ෂණය වී ඇති අතර දුර්ලභ ශාක, වනාන්තර තුළින් වඳ වී ගොස් ඇති ශාක, ශ්‍රී ලංකාවට පමණක් ආවේනික ශාක, වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති ශාක විශේෂ රාශියක් මෙම සංරක්ෂිත ශාක අතරට ඇතුළත් ය. මෙම උද්භිද උද්‍යානවලට අමතරව ගනේවත්ත වන ඖෂධ උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ ශාක සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම පිණිස දායක වේ.

උද්භිද විද්‍යාත්මක සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශාක පිළිබඳ විවිධ නිගමනයන් සහ සත්‍යබව තහවුරු කිරීමේ කාර්යයන් ද කරනු ලබන්නේ ජාතික ශාකාගාරයෙනි. මල්වගා සංවර්ධන සහ පර්යේෂණ අංශය විසින් මල්වගා පර්යේෂණ සහ විවිධ වැඩසටහන් මගින් මල්වගා සංවර්ධන කටයුතු සිදුකරමින් ඒ හරහා රට තුළ මල්වගා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සිදුකෙරේ. කෙටිකාලීන පුහුණු පාඨමාලා, එක් අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් සහ අනෙකුත් අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබයි.

මහජනතාවට විනෝදාස්වාදය ලබා දීම, ලොව පුරා ශාක වල විවිධත්වය සහ ශාක රාජධානියේ අලංකාරීත්වය රස විඳීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම, ශාක පිළිබඳ දැනුම ලබා දීම හරහා ශාක ප්‍රජාව වෙත ඔවුන් සමීප කරවීම ද ජාතික උද්භිද උද්‍යාන තුළින් සිදුවන මහඟු කාර්යයකි.

### 1.2 .දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වාගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.

### 1.3 මෙහෙවර

ස්වාභාවික සහ නිර්මිත පරිසරයන් තුළ ඇති ශාක සම්පත් අධ්‍යයනයට, තිරසාර සංරක්ෂණයට, අගය කිරීමට මහජනතාවට අවස්ථාව සලසා දෙමින් ඔවුන් ශාක වෙත සමීප කරවීම.


## 1.4. ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමෙහිලා විතැන් සංරක්ෂණ ක්‍රමවේද සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
2. අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව හා ශාක සම්පත් බැඳී පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
3. ශ්‍රී ලංකාවේ මල්වගා කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත් හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
4. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම.
5. සුදුසු ස්ථානවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම.
6. අලංකරණ උද්‍යාන විද්‍යාව ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම
7. ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබා දීම.
8. අනුරාධපුර ජයසිරි මහබෝධින් වහන්සේගේ සෞඛ්‍ය, ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම.

## 1.5 කාර්ය මණ්ඩල විස්තර

| කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 13 |
| තෘතීය මට්ටම | 10 | 04 |
| ද්විතීය මට්ටම | 189 | 126 |
| ප්‍රාථමික මට්ටම | 791 | 605 |
| **එකතුව** | **1024** | **748** |

## 1.6 සංවිධාන සැලැස්ම




** රා.උ.උ. - රාජකීය උද්භිද උද්‍යානය

තෙ.ක.උ.උ. - තෙත් කලාපිය උද්භිද උද්‍යානය

ස.අ. කාර්යාලය - සහකාර අධ්‍යක්ෂ කාර්යාලය

වියලි ක.උ.උ.- වියලි කලාපිය උද්භිද උද්‍යානය

## 1.7 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන සහ ඒකක

**පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය**

1821 දී ස්ථාපිත පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දෙමින් ශාක පිළිබඳ අධ්‍යයනයන්ට හා සංරක්ෂණ කටයුතු සඳහා දායකත්වයක් ලබා දෙයි.

හෙක්ටයාර 61.25ක් වූ උද්‍යානය මහනුවර නගරය සමීපයෙහි පිහිටා ඇති අතර, ශාක පිළිබඳ අධ්‍යයනයන්ට, උද්භිද හා පරිසර විද්‍යාත්මක පර්යේෂණයන්ට, විවිධ වටිනා, ඓතිහාසික වටිනාකමක් ඇති වඳවී ගොස් ඇති, තර්ජනයට ලක් වී ඇති ශාක ප්‍රදර්ශනයට මෙන්ම මහජනතාවට විනෝදාස්වාදය ලබා දීමට ද දායක වන ස්ථානයක් ලෙස ප්‍රචලිත ය.

**ජාතික ශාකාගාරය**

ජාතික ශාකාගාරය ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක්රැස් කර ඇති ස්ථානයකි. වෙනත් බොහෝ විදේශික ශාක සහ අනෙකුත් වගා කරන ශාකවල නිදර්ශක 160,000 ආසන්න ප්‍රමාණයක් යෝග්‍ය තත්ත්වයන් යටතේ ක්‍රමානුකූල අධ්‍යයනය සහ විමර්ශන කාර්යයන් සඳහා සංරක්ෂණය කරමින් තබා ඇත. 3,500 පමණ ග්‍රන්ථ සහ සෙසු ශාක හා සම්බන්ධ වූ පොත් පත්, සඟරා ද ශාකාගාරයේ තැන්පත් කර ඇත.

ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශක, ශාක වර්ගීකරණ පර්යේෂණ සඳහා මෙන්ම ජෛව විවිධත්ව අධ්‍යන කටයුතු සඳහා දත්ත බැංකුවක් ලෙසද ශාක හඳුනා ගැනිමේ කාර්යයන් සඳහා යොදා ගනී.

**හක්ගල උද්භිද උද්‍යානය**

හක්ගල උද්භිද උද්‍යානය වර්ෂ 1861 දි ආරම්භ කරන ලද අතර උද්‍යානයට අයත් බොහෝ ශාක සෞම්‍ය කලාපීය ශාක වේ. මෙම ශාක එකතුව ශ්‍රී ලංකාවට ආවේණික ශාකවල මෙන්ම වෙනත් රටවලින් හඳුන්වාදුන් කඳුකර හා ඒ ආශ්‍රිත ශාක වල එකතුවකි. මේවා උද්‍යානයේ විවිධ අංශවල ක්‍රමානුකූලව සිටුවා ඇත.

**ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය**

ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදී. ඉතා පැරණි ඉතිහාසයක් ඇති එය උද්භිද විද්‍යාත්මකව හා උද්‍යාන විද්‍යාත්මක වශයෙන් ආකර්ෂණීය ස්ථානයකි. එය ගම්පහ පිහිටා ඇති අතර, වපසරිය හෙක්ටයාර 17.4 කි. ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවල ශාක විශේෂයන් 2000 ක පමණ සංකලනයකින් මෙම උද්‍යානය සමන්විත වේ.

**මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය, පේරාදෙණිය**

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන අංශය, මල්වගා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ මල්වගා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කැපවී සිටී.

ශ්‍රී ලංකාවේ මල් වගාකරුවන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍රයේ උපදේශන සේවා හා ආයෝජන අවස්ථා පිළිබඳව තොරතුරු, උපකරණ සහ තත්ත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය ලබා දීම සඳහා මෙම ඒකකය ක්‍රියාකාරීව දායක වේ.

**ගනේවත්ත වන ඖෂධ උද්‍යානය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. උද්‍යානය හෙක්ටයාර 21.04 ක වපසරියකින් යුක්ත වන අතර, ඖෂධ පැළෑටි සංකලනයක් විශාල පරාසයක පැතිරී ඇත. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පහසුවෙන් සොයා ගත නොහැකි දුර්ලභ ඖෂධීය පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඖෂධ පැළෑටි ක්‍රමවත්ව වගා කිරීම සහ පැළෑටි එකතු කිරීමේ ක්‍රම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමෙහි නිරත වී සිටියි.

**මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය**

දේශිය විශේෂඥයින් විසින් අවුරුදු 130 කට පසු සැළසුම් කොට බිහි වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර එහි සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2013 වර්ෂයේ දි මහජනතාවට විවෘත කරන ලදී .
වියළි සහ ශුෂ්ක කලාපීය ශාකවල විතැන් සංරක්ෂණය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට දායක වීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වේ.

**සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය**

අවිස්සාවේල්ල ප්‍රදේශයට ආසන්නව මෙම උද්‍යානය පිහිටා ඇති අතර, සංවර්ධන කටයුතු 2008 වසරේදී ආරම්භ කරන ලද අතර 2015 දී මහජනතාවට විවෘත කරන ලදී. උද්භිද උද්‍යානය හෙක්ටයාර 42.49 වපසරියකින් යුක්ත ය.
පහතරට තෙත් කලාපීය ශාක විතැන් සංරක්ෂණය කිරීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වී ඇත. විවිධ ශාක විශේෂවල ආර්ථික, සෞන්දර්යාත්මක සහ පරිසර විද්‍යාත්මක ලක්ෂණ විදහා දක්වමින් පුද්ගලයන් සඳහා විනෝදාස්වාදය ගෙන දෙන ආකර්ශනීය ස්ථානයක් ලෙස මෙම උද්‍යානය එහි කාර්යයන් සිදු කරනු ලබයි.

**සුවහස් මල් සෙවන කාර්යාලය , නාරාහේන්පිට.**

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි මල්වගා කරුවන්ගේ "සුවහස් මල්" සංගම්වල මල්වගා නිෂ්පාදන අලෙවිය සඳහා පහසුකම් සැලසීම දෙපාර්තමේන්තුවේ ඒකකයක් වන නාරාහේන්පිට පිහිටි "සුවහස්මල් "ඒකකයෙන් සිදු කරනු ලබයි.

**අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස උද්‍යාන**

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ, මහනුවර, නුවරඑළිය, අනුරාධපුර පිහිටි නිල නිවාස උද්‍යානයන් සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි නිලනිවාසබද උද්‍යානයන්හි නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

**පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්**

පළමු සහ දෙවන ලෝක යුද්ධයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ හමුදා සේවයට අයත් නිලධාරීන් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක මහනුවර, ජාවත්ත, බොරුල්ල සහ ත්‍රිකුණාමල ප්‍රදේශවල පවත්වා ගෙන යන අතර දෙපාර්තමේන්තුව මගින් යුධ සොහොන් ඒකක උද්‍යානවල කළමනාකරණ කටයුතු සිදු කරනු ලබයි.

**හරිත පියස පුහුණු මධ්‍යස්ථානය, මීගලෑව**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්තමාන වපසරිය හෙක්ටයාර 2.43 කි. එය දැනට සංවර්ධනය වෙමින් පවතී. මල් වගාව පිළිබඳව පාඨමාලා අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට සහ දේශිය ජනතාවට පවත්වාගෙන යන අතර ශාක ප්‍රචාරණය සිදුකරන මධ්‍යස්ථානයක් ලෙස ද කටයුතු කරනු ඇත.


## 2. 2018 වසරේ ලැබූ ප්‍රගතිය

### 2.1. සංචාරක පැමිණීම


2018 වසරේදී ද ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ඒකක ඉහළ මට්ටමකින් පවත්වා ගෙනයන ලදී.

මෙම වසරේ උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි මුලු සංචාරකයන් සංඛ්‍යාව 2,828,344 ක් වේ. මෙම සංචාරකයන්ගෙන් 2,364,649 ක් දේශීය සංචාරකයින් වන අතර 463,695 ක් විදේශීය සංචාරකයින් වේ.

**2018 වසරේ උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාත්මක තොරතුරු**




උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය විදේශීය සංචාරකයින් සංඛ්‍යාවන්




**2017 හා 2018 වසරවල දී උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය විදේශීය සංචාරකයින් ගේ සන්සන්දනාත්මක තොරතුරු**

## 2.2. 2014 වර්ෂයේ සිට 2018 වසර තෙක් උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගේ තොරතුරු

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| දේශීය නරඹන්නන් සංඛ්‍යාව | 1,893,522 | 2,215,702 | 2,593,252 | 2,397,347 | 2,364,649 |
| විදේශීය නරඹන්නන් සංඛ්‍යාව | 345,468 | 407,553 | 465,405 | 440,207 | 463,695 |
| එකතුව | **2,238,990** | **2,623,255** | **3,058,657** | **2,837,554** | **2,828,344** |

## 3. ආදායම

2018 වර්ෂයේ දී ඇතුල්වීමේ ගාස්තු, පැළ අලෙවිය යන ආදියෙන් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ලබාගත් සම්පූර්ණ ආදායම රුපියල් මිලියන 861.9 කි. (නරඹන්නන් ගෙන් රුපියල් මිලියන 784.77ක් ද පැළ අලෙවියෙන් හා අනෙකුත් විදි හරහා රුපියල් මිලියන 77.13 ක් ද වශයෙනි). එය පසුගිය අවුරුද්දේ ඉහත කාල පරිච්ඡේදයට (රුපියල් මිලියන 827 කි.) සාපේක්ෂව 5% ක වැඩිවීමකි.

## 3.1. 2014 වර්ෂයේ සිට 2018 වසර දක්වා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ලබාගත් ආදායම

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| දේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 75.9 | 88.5 | 115.4 | 113 | 111.34 |
| විදේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 369.8 | 435.1 | 594.3 | 640 | 673.43 |
| එකතුව (රු.මි) | **445.7** | **523.6** | **709.7** | **753** | **784.77** |

## 4. මූල්‍ය ප්‍රගතිය

ප්‍රධාන උද්‍යානයන් හි සහ අනෙකුත් ඒකකවල සංවර්ධන කටයුතු සැළසුම් කළ පරිදි සිදුවූ අතර 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට දෙපාර්තමේන්තුවේ මූල්‍යමය ප්‍රගතිය 97% ක් විය.

### 4.1. මූල්‍ය ප්‍රගති සාරාංශය - 2018

| ප්‍රාග්ධන, පුනරාවර්තන මුළු එකතුව | ප්‍රතිපාදන (රු.මි) | සත්‍ය වියදම (රු.මි) | අතැති බිල් (රු.මි) | මුළු වියදම | % |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන මූල්‍ය වෙන්වීම් | 397.70 | 347.24 | 37.216 | 384.456 | 97 |
| පුනරාවර්තන මූල්‍ය වෙන්වීම් | 412.51 | 402.746 | 1.981 | 404.727 | 98 |
| මුළු මූල්‍ය වෙන්වීම් | 810.21 | 749.986 | 39.197 | 789.183 | 97 |

### 4.2.1. 2018 වර්ෂයේ ඒකාබද්ධ ප්‍රතිපාදන වල වියදම

| | 2018 දී වෙන් වූ රජයේ ඒකාබද්ධ ප්‍රතිපාදන (රු.මි) | 2018 දී ඒකාබද්ධ ප්‍රතිපාදන සත්‍ය වියදම (රු.මි) | අතැති බිල්පත් (රු.මි) | මුළු වියදම අතැති බිල් සමග (රු.මි) |
|---|---|---|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 8.295 | 7.984 | 0.308 | 8.292 |
| ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධනය | 23.710 | 22.369 | 0.0 | 22.369 |
| හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය | 4.595 | 2.072 | 2.079 | 4.151 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය | 6.870 | 5.514 | 1.268 | 6.782 |
| මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 7.50 | 6.90 | 0.588 | 7.488 |
| අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන | 0.50 | 0.451 | 0.0 | 0.451 |
| ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන | 1.570 | 0.246 | 1.320 | 1.566 |
| ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන | 60.50 | 57.370 | 3.119 | 60.489 |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 29.090 | 28.266 | 0.459 | 28.725 |
| මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 65.370 | 63.630 | 1.679 | 65.309 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු සහ උද්භිද උද්‍යානයන් හි අලංකාරය හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම | 4.70 | 4.20 | 0.253 | 4.453 |
| අයවැය යෝජනා මගින් මල්වගා සංවර්ධන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ලැබුණු මුදල | 10.0 | 0.0 | 0.0 | 0.0 |
| එකතුව | **222.70** | **199.002** | **11.073** | **210.075** |

### 4.2.2 උද්භිද උද්‍යාන භාර අරමුදලේ ප්‍රතිපාදනවල වියදම

| | 2018 දී උද්භිද උද්‍යාන භාර අරමුදලින් වෙන් වූ ප්‍රතිපාදන (රු.මි) | 2018 දී උද්භිද උද්‍යාන භාර අරමුදලින් වියදම (රු.මි) | අතැති බිල්පත් (රු.මි) | මුළු වියදම අතැති බිල් සමග (රු.මි) |
|---|---|---|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 66.225 | 43.482 | 22.742 | 66.224 |
| ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධනය | 8.115 | 7.563 | 0.534 | 8.097 |
| හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය | 45.890 | 44.819 | 1.066 | 45.885 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය | 0.000 | 0.000 | 0.00 | 0.000 |
| මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 0.000 | 0.000 | 0.00 | 0.000 |
| අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන | 1.125 | 1.123 | 0.00 | 1.123 |
| ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන | 16.000 | 14.066 | 1.801 | 15.867 |
| ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන | 0.000 | 0.000 | 0.0 | 0.000 |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 4.150 | 4.143 | 0.0 | 4.143 |
| මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 1.250 | 1.238 | 0.0 | 1.238 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු සහ උද්භිද උද්‍යානයන් හි අලංකාරය හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම | 32.245 | 31.411 | 0.0 | 31.411 |
| **එකතුව** | **175.0** | **147.845** | **26.143** | **173.988** |

**4.2.3.** **ඒකාබද්ධ හා උද්භිද උද්‍යානභාර අරමුදලේ මුළු ප්‍රතිපාදන වල**
**මුළු**
**වියදම**

| | **2018 දී වෙන්වූ මුළු ප්‍රතිපාදස (රු.මි)** | සත්‍ය වියදම (රු.මි) | මුළු වියදම අතැති බිල් සමග | සත්‍ය වියදම ප්‍රතිශතයක් ලෙස | මුළු වියදම අතැති බිල් සමග ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| **පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධනය** | 74.520 | 51.466 | 74.516 | 69 | 100 |
| ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධනය | 31.825 | 29.932 | 30.466 | 94 | 96 |
| හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය | 50.485 | 46.891 | 50.036 | 93 | 99 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය | 6.870 | 5.514 | 6.782 | 80 | 99 |
| මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 7.500 | 6.900 | 7.488 | 92 | 100 |
| අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන | 1.625 | 1.574 | 1.574 | 97 | 97 |
| ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන | 17.570 | 14.312 | 17.433 | 81 | 99 |
| ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන | 60.500 | 57.370 | 60.489 | 95 | 100 |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 33.240 | 32.409 | 32.868 | 97. | 99 |
| මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 66.260 | 64.868 | 66.547 | 97 | 100 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු සහ උද්භිද උද්‍යානයන් හි අලංකාරය හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම | 36.945 | 35.611 | 35.864 | 98 | 99 |
| අයවැය යෝජනා මගින් මල්වගා සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලැබුණු මුදල | 10.000 | 0.000 | 0.000 | 0 | 0 |
| **එකතුව** | **397.700** | **346.847** | **384.063** | **87** | **97** |

## 5. 2018 වර්ෂයේ උද්භිද උද්‍යානයන්හි හි සිදු වූ සංවර්ධන වැඩසටහන්

සියළුම උද්‍යානයන්හි භූමි අලංකරණ කටයුතු නිසි පරිදි සිදුකිරීම තුළින් ද නව සංවර්ධිත ප්‍රදේශ, අඩිපාරවල්, වීදි, උද්‍යානයේ විවිධ අංශ කාර්යක්ෂමව නඩත්තු කිරීම තුළින් ද උද්‍යානයන් හි අලංකරණය හා තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

### 5.1 රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

| |
|---|
| අනුමත ප්‍රතිපාදන :- ප්‍රාග්ධන වෙන්කිරීම් වලින් රු. මි. 8.295 ක් සහ උද්‍යාන භාරකාර අරමුදල රු.මි. 66.225<br>2018 වැය (අතැති බිල්පත් සමග) :- රු.මි. 74.516 |

- වැඩ අවසන් කරන ලද ශාක සංරක්ෂණාගාරයේ අභ්‍යන්තර සැලසුම් නිර්මාණ කටයුතු සහ ඇතුළත ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම් සාර්ථක ව අවසන් කරන ලද අතර මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලදී.



**ශාක සංරක්ෂණාගාරයේ නිමවූ අභ්‍යන්තර නිර්මාණ කටයුතු**

- උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධති, බෝක්කු හා ජලාපවහන පද්ධති වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකරන ලද අතර ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම මගින් උද්‍යානයට නව පෙනුමක් ද ලබා දීමට කටයුතු කරන ලදී.

- උද්‍යානයේ ප්‍රධාන මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මාර්ග දෙපස ගඩොල් ඇල්ලීම (Curbing) සිදු කරන ලදී.

- උද්‍යානයේ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකරමින් පවතින අතර එයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම්, ආකෘති ස්ථාපිත කිරීම් කටයුතු සිදු කරන ලදී.

- සේවකයින් සඳහා අළුතින් වැසිකිළියක් ඉදිකරන ලද අතර පැවති කාර්යාල වැසිකිළි පද්ධතිය නවීකරණය කරන ලදී.

- උද්‍යානයේ නිලධාරී නිල නිවාස 02 ක් ද අලුත්වැඩියා කරන ලදී.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් පඳුරු, හණ සහ වැටකෙයියා ශාක එකතුන් වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 209,859 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී. මීට අමතර ව නව බීජ තවානක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදුවන අතර එලිමහන් පැළ තවානෙහි අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.



**අළුත්වැඩියා කරන ලද උද්‍යානයේ කැෆටේරියා ආපන ශාලාවේ වහලය**

- පර්ණාංග ශාක එකතුව සඳහා වන ජලසම්පාදන පද්ධතියෙහි වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කරන ලදී.

- වනෝද්‍යාන පැළ තවාන සඳහා ආරක්ෂිත වැටක් ස්ථාපිත කිරීම් කටයුතු සහ පැළ බඳුන් ගත කරන ගෘහයක් ඉදිකිරීමේ කටයුතු සිදු කරන ලදී.

- උද්‍යානයට අත්‍යාවශ්‍ය අංගයක් වන තොරතුරු මධ්‍යස්ථානයක් සහිත කෞතුකාගාරය ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර අතර එම කටයුතු 2019 වසරේදී නිම කිරීමට නියමිතය.



**වැඩ අවසන් කරන ලද උද්‍යාන යන්ත්‍රෝපකරණ නවතා තැබීම සහ ගබඩා කිරීම සඳහා සැකසූ ගොඩනැගිල්ල**

- උද්‍යානයේ ශාක කොටස්වල ප්‍රතිශෝධන කටයුතුද සිදුකරමින් පවතින අතර C කොටස අවසන් කර ඇත.

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දිය හැකි තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකස් කරන ලදී. පැමිණෙන නරඹන්නන් හට උද්‍යානය පිළිබඳ තොරතුරු ලබා දීමට උද්‍යානය තුළ

සංචාරය සඳහා මගපෙන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර වැඩසටහන් 5 ක් පවත්වා නරඹන්නන් 150 දෙනෙකු සඳහා එම සේවාව සපයා ඇත.

- නරඹන්නන් සඳහා පානීය ජල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ලීටර් 10,000 ජලටැංකි දෙකක් මිලදී ගෙන ස්ථාපන කටයුතු සිදු කරන ලදී.
- උද්‍යානයේ ආරක්ෂාව තර කිරීමේ අරමුණින් CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු ද සිදු කරන ලදී.
- වැඩි නරඹන්නන් පිරිසක් සඳහා එකවර උද්‍යානය නැරඹීමේ පහසුව වැඩිදියුණු කිරීම සඳහා බැටරි බලයෙන් ධාවනය වන බස් රථයක් හා උද්‍යානයේ පිරිසිදු බව පවත්වා ගැනීම කාර්යක්ෂම කිරීම සඳහා ස්වයංක්‍රීයව පැදගෙන යා හැකි කොළ එකතු කිරීමේ යන්ත්‍රයක් ද මිලදී ගැනීම් කටයුතු සිදුකර ඇත.
- මිලදී ගැනීම් කටයුතු, උද්‍යාන යන්ත්‍රෝපකරණ නවතා තැබීම සහ ගබඩා කිරීම සඳහා ගොඩනැගිල්ලක් ද ඉදි කර ඇත.
- උද්‍යානයේ පැළ අලෙවි සැලෙහි වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කරන ලදී.
- නරඹන්නන් සඳහා ආසන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අළුතින් බංකු මිලදී ගැනීම් කටයුතු සිදු කරන ලදී.
- උද්‍යාන කටයුතු සඳහා ජලය ලබා දෙන මාඔය ජල සැපයුම අළුත්වැඩියා කිරීම් කටයුතු සිදු කරමින් පවතී.
- උද්‍යානයේ කැෆටේරියා ආපන ශාලාවේ වහලය අළුත්වැඩියා කටයුතු නිම කරන ලද අතර එහි අපජලය පිරිපහදුව සඳහා පල්දෝරු වලක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කරන ලදී.
- පර්ගෝලාවෙහි අළුත්වැඩියා කටයුතු නර්ඩ් ආයතනය හා එක්ව නිම කර ඇත.
- උද්‍යානයේ ප්‍රධාන මාර්ග දෙපස වර්ණවත් කලු ගල් ඇල්ලීමේ කාර්යය සිදුකරමින් පවතින අතර 2019 දී එය නිම කිරීමට බලාපොරොත්තු වේ.

## 5.2 හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය, ගම්පහ

අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන වෙන්කිරීම් වලින් රු. මි 23.710 ක් සහ උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි 8.115

2018 වැය (අතැති බිල්පත් සමග) : රු.මි. 30.466

- උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිල නිවාස, පැළ ගෘහ, උද්‍යානය වටා තාප්පය, ගිම්හාන කුටි සහ සෙවන ගෘහයෙහි අළුත්වැඩියා කටයුතු සිදුකරන ලද අතර උද්‍යානයේ තත්ත්වය ඉහළ මට්ටමකට නඟා සිටුවීම සඳහා භූමි සංවර්ධන හා වැඩිදියුණු කිරීම් කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු ද සිදු කරන ලදී.



**වැඩ අවසන් කරන ලද ඕකිඩ් ශාක ගෘහයෙහි ඇතුලත දර්ශනයක්**

- උද්‍යානයට අවශ්‍ය නව ගරාජයක ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.
- උද්‍යානයේ ප්‍රධාන නිල නිවස අළුත්වැඩියා කරන ලද අතර ආරක්ෂිත බැම්මෙහි කොටසක් පිලිසකර කරන ලදී.
- නරඹන්නන් ගේ භාවිතය සඳහා පලතුරු උද්‍යානය අසල ගිම්හාන කුටියෙහි වැඩ අවසන් කර ඇත.



**බඳුන්ගත මල් පැළ විවිධ ආකෘතිවලට ඇතුලත් කර මහජන ප්‍රදර්ශනය සඳහා සකස් කර ඇති අයුරු**

- උද්‍යානයේ සේවක පහසුකම් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය දෙමහල් ගොඩනැගිල්ලේ දෙවන අදියරෙහි ඉදිකිරීම් කටයුතු සිදු කර ඇත. සේවකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා යන්ත්‍ර සූත්‍ර ගබඩා කිරීම සඳහා මෙය භාවිතා කිරීමට බලාපොරොත්තු වේ.



පලතුරු උද්‍යානය අසල අලුතින් ඉදිකරන ලද ගිම්හාන කුටිය

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 81,838 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී. උද්‍යානයේ ශාක එකතුවට අදාල ශාක නාම පුවරු ද සවි කිරීම සිදුකරන ලදී.

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දිය හැකි තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකස් කරන ලදී.

- උද්‍යානය වෙත නරඹන්නන් පැමිණෙන ප්‍රමාණය වර්ධනය කිරීමේ අරමුණින් මහජන ප්‍රදර්ශනය සඳහා ඕකිඩ් ශාක ගෘහයක් ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද අතර එහි වැඩ අවසන් කරන ලදී.

- උද්‍යානයේ වනෝද්‍යානය සඳහා අලුතින් ශාක එක් කරන ලද අතර සමනලුන් ආකර්ශනය වන ශාක එක් කරමින් සමනල උද්‍යාන වැඩිදියුණු කරන ලදී.



පිළිසකර කරන ලද ආරක්ෂිත බැම්මෙහි කොටසක්

- උද්‍යාන අලංකරණය වැඩිදියුණු කිරීම සඳහා බඳුන්ගත මල් පැළ විවිධ ආකෘති වලට ඇතුළත් කර මහජන ප්‍රදර්ශනය සඳහා වසර පුරාම පවත්වාගෙන යන පරිදි සිදු කිරීමට කටයුතු ආරම්භ කර අවශ්‍ය මල් පැළ හා ආකෘති සකස් කිරීමද සිදු කරන ලදී.
- පැළ තවානෙහි ආරක්ෂාව සඳහා එය වටා ආරක්ෂිත වැටක් ඉදිකරන ලදී.
- උද්‍යානයෙහි විදුලි පරිභෝජනය සඳහා යන වියදම අවම කිරීම සඳහා සූර්ය බලශක්ති කෝෂ පද්ධතියක් ස්ථාපිත කරන ලදී.
- උද්‍යානයේ කුඩා ළමුන් සඳහා ස්ථාපිත වෘක්ෂ ගෘහය අළුත්වැඩියා කරන ලද අතර ප්‍රධාන දොරටුව අසල ඩිජිටල් තොරතුරු පුවරුවක් ස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත.



**අළුත්වැඩියා කරන ලද උද්‍යානයේ ස්ථාපිත කුඩා ළමුන් සඳහා වන වෘක්ෂ ගෘහය**

## 5.3 හක්ගල උද්භිද උද්‍යානය


| |
|---|
| අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන වෙන්කිරීම් වලින් රු. මි. 4.595 ක් උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි.45.890 |
| 2018 වැය (අතැති බිල්පත් සමග)   රු.මි. 50.036 |

- උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිල නිවාස, පැළ ගෘහ, ගිම්හාන කුටි, සංචාරක බංගලාවෙ හි හා වෙනත් ආකෘති වල තීන්ත ආලේප කර අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී.
- කාර්ය මණ්ඩල නිල නිවාස වලට අමතර ව අළුතින් නිල නිවාස 4 ක් සහිත නිවාස සංකීර්ණයක ඉදි කිරීම් වැඩ කටයුතු අවසන් වී ඇත.

- උද්‍යානයේ නව පිවිසුම් දොරටුව අසල ගිම්හාන කුටියක් ස්ථාපිත කරන ලදී.

- උද්‍යානයේ ඇතුළත පිහිටි පැළ අලෙවි සැලට අමතරව උද්‍යානයේ පිටවන දොරටුව අසල පැළ අලෙවි සැලක් ස්ථාපිත කිරීම සඳහා ටෙන්ඩර් පිරිනමන ලද අතර එහි වැඩ කටයුතු 2019 වසරේදී සිදු කිරීමට නියමිතය. ඒ මඟින් උද්‍යානයට නොපැමිණෙන බාහිර පුද්ගලයන් හටද පැළ මිලදී ගැනීමේ අවස්ථාව ලැබෙනු ඇත.

- උද්‍යානය වටා ආරක්ෂිත වැටෙහි කොටසක ස්ථාපිත කිරීම් කටයුතු නිම කරන ලදී.



ගල් අතුරා උද්‍යානයේ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කර ඇති ආකාරය

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර පැළ 137,690 ප්‍රමාණයක් නිපදවන ලදී. අවශ්‍ය ශාක නාම පුවරු ද සවි කරන ලදී.

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දිය හැකි පත්‍රිකා, පුවරු සකසා මුද්‍රණය වෙමින් පවතී.

- 2017 වර්ෂයේදී පස සම්බන්ධව තාක්ෂණික ගැටළුවක් පැන නැගීම හේතුවෙන් නවතා දැමීමට සිදු වූ උද්‍යානයේ නව පිවිසුම් දොරටුව අසල රථගාලෙහි ඉදි කිරීමේ කටයුතු අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලැගෙන මෙම වර්ෂයේදී ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් පිරිනමන ලදී.



ස්ථාපිත කරන ලද උද්‍යානය වටා ආරක්ෂිත වැටෙහි කොටසක්

- උද්‍යානයේ තත්ත්වය ඉහළ මට්ටමකට නගා සිටුවීම සඳහා භූමි සංවර්ධන කටයුතු සහ සෙසු නඩත්තු සිදුකරන ලදී.

- උද්‍යානයේ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ගල් ඇතිරීමේ කටයුතු සිදු කරන ලදී.

- උද්‍යානය සඳහා අඩුවක්ව පැවති ගබඩාවක් සහ ක්ෂේත්‍ර ස්ථානයක් ස්ථාපිත කිරීමේ කටයුතු වල පළමු අදියර නිම කර ඇත.

## 5.4. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය

අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන වෙන් කිරීම් වලින් රු. මි. 6.870 ක්

2018 වැය (අතැති බිල්පත් සමග) : රු.මි. 6.782

- උද්‍යානයේ බාහිර පෙනුම වැඩිදියුණු කිරීම සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් හි නඩත්තු කටයුතු සිදු කරන ලද අතර ඒ තුළින් උද්‍යානය උසස් තත්ත්වයකින් පවත්වා ගැනීමට කටයුතු සිදුකරන ලදී.




මුද්‍රණය කරන ලද, ඖෂධ ශාක පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා දිය හැකි පත්‍රිකා

- උද්‍යානයේ ශාක ප්‍රචාරණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 26,572 අධික ප්‍රමාණයක් නිපදවන ලද අතර ශාක එකතුන් අළුතින් ඇතිකිරීමේ කටයුතු ඇතුළුව ශාක එකතුන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.
- නරඹන්නන් සඳහා ඖෂධ ශාක පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා දිය හැකි තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු මුද්‍රණය කරන ලදී.
- ශාකාගාර කොටසෙහි සිවිලිම අළුත්වැඩියා කිරීමේ කටයුතු ද නිම කරන ලදී.




උද්‍යානය තුළ ස්ථාපිත ඖෂධ ශාක පිළිබඳ විස්තරාත්මක පුවරු

- ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් 1795 දෙනෙකු ඖෂධ ශාක භාවිතය, ඒවායෙහි වටිනාකම සහ සංරක්ෂණය පිළිබඳ දේශන පවත්වා දැනුවත් කරන ලදී.
- නියං කාලයේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා වර්ෂා ජලය එක් රැස් කරන ජල ටැංකි දෙකක් ස්ථාපිත කිරීමට කටයුතු සිදු වෙමින් පවතී.

- උද්‍යානයේ දේශනාගාරය අසල කාණු පද්ධතිය පිළිසකර කරන ලද අතර ඉඩම් වැඩිදියුණු කිරීමේ කටයුතු ද සිදුකර අවසන් කර ඇත.

## 5.5 ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ

| |
|---|
| අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන වෙන් කිරීම් වලින් රු.මි.1.570 ක් සහ<br>උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රුපියල් මි. 16.00 ක්<br>2018 වැය (අතැති බිල්පත් සමග) : රු.මි. 17.433 |

- ශාක හඳුනාගැනීම සහ ක්ෂේත්‍ර ගවේශන පිළිබඳ දෙදින වැඩමුළුවක් හා එක්දින වැඩමුළුවක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිළධාරීන් හා අදාළ අනෙකුත් සේවක මහත්ම මහත්මීන්ගේ දැනුම හා ධාරිතාවය වර්ධනය කිරීම සඳහා සංවිධානය කරන ලදී. මේ සඳහා සම්පත් දායකයන් ලෙස උද්භිද විද්‍යාඥයින් වන මහාචාර්ය නිමල් ගුණතිලක මහතා හා මහාචාර්ය සාවිත්‍රී ගුණතිලක මහත්මිය සහභාගී වන ලදී.

  මෙහිදී නිවැරදිව ශාක හඳුනා ගන්නා ලක්ෂණ හා ක්ෂේත්‍ර ගවේෂණ සිදු කරන ආකාරය පිළිබඳව හරවත් දේශන හා පුහුණු සැසි ආධාරයෙන් දෙපාර්තමේන්තු නිළධාරීන් වෙත දැනුම ලබා දෙන ලදී.



**උද්භිද විද්‍යාත්මක ශාක ගවේශන වැඩසටහන යටතේ ශාක ගවේශන කටයුතු සිදු කරමින්**

- මීට අමතරව ජාතික ශාකාගාරය හා එහි කාර්ය භාරය, ශාකාගාර තාක්ෂණය, ශාක හඳුනාගැනීම, ශාක වර්ගීකරණය හා ජෛව විවිධත්වය පිළිබඳ පාසල් සිසුන් 653 ක්ද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිළධාරීන් 436 ක්ද විශ්ව විද්‍යාල සිසුන් 655 ක්ද දැනුවත් කරන ලදී.

- උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් විල්පත්තු ජාතික උද්‍යානයේ ශාක ගවේෂණ කටයුතු, රත්නපුර ප්‍රදේශයේ පිහිටි බඹරබොටුව වන රක්ෂිතය තුල ශාක ගවේෂණකටයුතු, ගනේවත්තේ ඖෂධ ශාක පිළිබඳ ව්‍යාපෘතිය, ක්‍රිප්ටොකොරයින් (Cryptocorine) ශාක ගණයේ ශාක වර්ගීකරනය හා ශාක මල් ඵල හට ගන්නා කාලයන් පිළිබඳව අධ්‍යන කටයුතු, කඳු මුදුන් ආශ්‍රිත ශාක ප්‍රජාවන් පිළිබඳ පරිසර විද්‍යාත්මක අධ්‍යන කටයුතු සිදු කරන ලදී.



**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පැවැත්වූ ශාක හඳුනාගැනීම සහ ක්ෂේත්‍ර ගවේෂණ පිළිබඳ වැඩමුළුවේ මහාචාර්ය සාවිත්‍රී ගුණතිලක මහත්මිය දේශනයක් පවත්වමින්**

- මෙහිදී උද්භිද විද්‍යාත්මක ක්ෂේත්‍ර ගවේෂණ 19 ක් සිදු කරන ලද අතර සජීවී සපුෂ්පික ශාක නිදර්ශක 802 ක් මීවන ශාක නිදර්ශක 22 ක් සහ පාසි ශාක නිදර්ශක 28 ක් එකතු කෙරිණි.

- මෙම ශාක නිදර්ශක අතුරින් තර්ජනයට ලක්වූ ශාක හඳුනාගැනීම සිදුකළ අතර, වඳ වී ගිය ශාක කාණ්ඩයේ එක් ශාක විශේෂයක්ද, දැඩි ලෙස වඳ වී යාමේ අවදානමට ලක්වූ ශාක 6ක්ද, වඳ වී යාමේ අවදානමට ලක්වූ ශාක 133 ක් ද, අනාගතයේ දී අවදානමට ලක්විය හැකි ශාක 212 ක්ද, තර්ජනයට ලක්වීමට ආසන්න ශාක 124 ක් ද හඳුනා ගන්නා ලදී. ශාක විතැන් සංරක්ෂණ ක්‍රමවේද යොදා ගනිමින් අවශ්‍ය අවස්ථා වලදී ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලද අතර රැස් කර ගන්නා ලද නිදර්ශක ජාතික ශාකාගාරයේ අනාගත විමර්ශනය සඳහා තැන්පත් කිරීමට ද කටයුතු කර ඇත.



**පාසල් සිසුවියන් පිරිසක් දැනුවත් කරමින්**

- උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහනට අමතරව දුර්ලභ ඖෂධීය පැළෑටි ගවේෂණය සඳහා ද වැඩසටහනක් පේරාදෙණිය උද්භිද උද්‍යානය සමඟ එක්ව ආරම්භ කරන ලදී. මෙහිදී සිදුකරන ලද ක්ෂේත්‍ර ගවේෂණ වලදී දුර්ලභ ඖෂධීය පැළෑටි විශේෂ

එකතු කරන ලද අතර සංරක්ෂණ කටයුතු සඳහා ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට භාර දෙන ලදී. මෙම වැඩසටහන මඟින් ගනේවත්ත පිහිටි වන ඖෂධ උද්‍යානය පැළෑටි එකතුව වැඩිදියුණු කිරීමද අරමුණු වේ.



ජාතික රතු දත්ත නාමාවලි ග්‍රන්ථය සැකසීමේ ව්‍යාපෘතියෙහි රැස්වීමක් පවත්වමින්

- පාසි සංරක්ෂණ වැඩසටහනක් ද ශාකාගාරය මඟින් සිදුකරන ලද අතර ක්ෂේත්‍ර ගවේෂණ වලදී එකතු කරගන්නා පාසි ශාක විශේෂ එකතුවක් රාජකීය උද්භිද උද්‍යානය තුල ස්ථාපිත කර පවත්වාගෙන යාම සිදු කරන ලදී.
- ජාතික ශාකාගාරය මගින් ජාතික රතු දත්ත නාමාවලි ග්‍රන්ථය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා මහඟු දායකත්වයක් මෙම වසර තුළදී ද සපයන ලද අතර,ශාක නිදර්ශක ඇගයීම්,තොරතුරු එක් රැස්කිරීම හා ශාක නාම තහවුරු කිරීමේ කටයුතු සිදුකරන ලදී.
- මීට අමතරව ජාතික ශාකාගාරයෙන් සිදුවන තාක්ෂණික සේවාවක් ලෙස ආශ්‍රිත නිෂ්පාදන සඳහා හා විවිධ ආයතන වල පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සඳහා බාහිර පුද්ගලයන් හා ආයතන සඳහා ශාක වල උද්භිද විද්‍යාත්මක නාම තහවුරු කිරීම හා හඳුනාගැනීමේ කටයුතු සිදු කරන අතර පර්යේෂණ අධ්‍යයන කටයුතු සඳහා ශාක 981 ක්ද නීතිමය කටයුතු සඳහා ශාක නිදර්ශක 21 ක්ද ශාක කර්මාන්ත සඳහා ශාක නිදර්ශක 14 ක්ද හඳුනාගන්නා ලදී.
- ලෝක ප්‍රසිද්ධියට පත් ඓතිහාසික වටිනාකමක් ඇති "හරමානිස් ද අල්විස් ශාක චිත්‍ර රූප එකතුව" ග්‍රන්ථයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා මුද්‍රණ කටයුතු සිදු කර ප්‍රකාශයට පත් කිරීම සිදුකරන ලදි.
- ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක්වූ ශාක, ආක්‍රමණික ශාක, පර්ණාංග සහ ක්ෂේත්‍ර ගවේශන හරහා එකතු කර ගන්නා ලද තර්ජනයට ලක් වූ ශාක පිළිබඳ අත් පත්‍රිකා වර්ග තුනක් හා එක් පෝස්ටරයක් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරිම සඳහා කටයුතු සිදුකරන ලදී.
- ජාතික ශාකාගාරයේ තැන්පත් රූප සටහන් සහ නිදර්ශක සංඛ්‍යාව නිර්ණයට සහ අධ්‍යයනය පහසු කිරීමේ අරමුණින් එම නිදර්ශක වලට ප්‍රවේශ අංකයන් (Accession number) ලබා දී ඒවා දත්ත පද්ධතියකට ඇතුළත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. මීට අමතරව ඉතා පැරණි නිදර්ශක ශාක එකතුවෙහි ඡායාරූප ගෙන ජාත්‍යාන්තර තත්ත්වයෙන් ඒවා ඩිජිටල්කරණය කිරීම හා තිර සංකේත ක්‍රමය භාවිතයෙන් ලේබල් කිරීම සිදු කරන ලදී.

- ජාතික ශාකාගාරයේ වහලයෙහි, නාන කාමරවල අළුත්වැඩියා කටයුතු සිදුකල අතර ජාතික ශාකාගාරය තුළ තැන්පත් කර ඇති නිදර්ශක නිසියාකාරව නඩත්තු කර පවත්වාගෙන යාමට කටයුතු සිදු කරන ලදී.
- ජාතික ශාකාගාරයේ විද්‍යාගාරවල පහසුකම් නංවාලීමේ අරමුණින් නව උපකරණ හා ආම්පන්න මිලදී ගැනීම සිදු කරන ලදී.

## 5.6. ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන අරමුදල් වලින් රු. මි.60.5 ක්

2018 වැය (අතැති බිල්පත් සමග) : රු.මි. 60.335

ශ්‍රී ලංකාවේ සුළු සහ මධ්‍ය ප්‍රමාණයේ මල්වගාකරුවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ආර්ථික තත්වයන් නගා සිටුවීමට මල්වගා සංවර්ධන වැඩසටහන මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී.



මල්වගා කරුවන්ගේ මල් පැළ සහ ආශ්‍රිත ද්‍රව්‍ය අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා පවත්වන ලද ප්‍රදර්ශනයක්

- දිවයින පුරා දැනට මල්වගා ව්‍යාප්තිය සඳහා ක්‍රියාත්මක වන මල්වගා ගොවි සංගම් ප්‍රමාණය 197 ක් වන අතර ඒ හරහා සාමාජිකයින් 8,500 ක් පමණ ප්‍රතිලාභ ලබයි. මෙම වැඩසටහන හරහා ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බෙරා, කැපූ පත්‍ර වගාවන් සහ පටක රෝපණය පිළිබඳ එක් දින පුහුණු පාඨමාලා වලින් පුද්ගලයින් 20684 ක් පුහුණු කර දැනුම ලබා දී ඇත.
- මල්වගා කරුවන්ගේ තාක්ෂණික සහ සෙසු නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රායෝගික වැඩමුළු ද පවත්වන ලද අතර



මල්වගා කරුවන්ගේ පැළ තවාන්ට ගොස් ඔවුන්ගේ ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ද ලබාදෙමින්

ඒ හරහා වගා කරුවන්හට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදෙන ලදී.

- මල්වගා කරුවන්ගේ මල් පැල සහ ආශ්‍රිත ද්‍රව්‍ය අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා සුළු පරිමාණ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශන 152 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ විශාල ප්‍රදර්ශන 28 ක් පවත්වන ලදී. මල් වගාකරුවන්ගේ පැළ තවාන් 445 කට ගොස් ඔවුන්ගේ ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ද ලබාදෙන ලදී.
- රටෙහි මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වර්තමාන හා අනාගත ක්ෂේත්‍ර අවශ්‍යතාවයන්ට සරිලන පර්යේෂණ කටයුතු සිදුකරන ලද අතර වර්තමානයේ වගාකරුවන් මුහුණ දෙන ගැටළු විසදීම සඳහා පර්යේෂණ කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව වාණිජමය මල්වගාව, තවාන් පාලනය, වගාවන් සම්බන්ධ පලිබෝධ සහ රෝග පාලනය ආශ්‍රිතව පැන නගින ගැටළු සම්බන්ධව පුද්ගලයින් සහ ආයතන සඳහා නොමිලයේ උපදේශන කටයුතු සිදු කරන ලදී.



**වගාකරුවන් සඳහා පුහුණු සැසි පවත්වමින්**

- ක්ෂේත්‍රයේ දී සහ රසායනාගාර පහසුකම් යටතේ නව ඕකිඩ් දෙමුහුන් වර්ග සහ ඇන්තූරියම් සැකසීම සඳහා අත්හදා බැලීමේ කටයුතු සිදු කරමින් පවතී.



**මල්වගා කරුවන් සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය ඔවුන් අතර බෙදාදෙමින්**

- සියලුම උද්‍යානයන් හි මල්වගා අංශ වල පැළ තවාන් උසස් මට්ටමකින් නඩත්තු කල අතර වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදු කරන ලදී. පේරාදෙණිය උද්‍යානයෙහි ඇන්තූරියම් පැළ තවාන් වල තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. ගම්පහ උද්භිද උද්‍යානයෙහි ඕකිඩ් සඳහා වන වීදුරු ගෘහය විශාල කිරීම් කටයුතු සිදු කරන ලදී.

- මල්වගාවන් පිළිබඳ පොත් පත්‍රිකා මුද්‍රණය කර ඇත.

- මල්වගා කරුවන් සඳහා උසස් ගුණාත්මක බවින් යුතු නව මල් ප්‍රභේද හඳුන්වා දීම සඳහා මව් ශාක මිලදී ගැනීම් කටයුතු සිදු කරන ලදී.

- මල්වගා කරුවන් සඳහා යටිතල පහසුකම් සැපයීමේ අරමුණින් අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය (පොලිතීන්, සෙවණ දැල්) සහ ප්‍රදර්ශන පැවැත්වීමට අවශ්‍ය කැනොපි හට් මිලදී ගැනීම් කටයුතු නිම කරන ලද අතර බෙදා දීම් කටයුතු සිදු කරමින් පවතී. මල්වගා කරුවන් ක්ෂේත්‍රයේ නියලීම දිරිමත් කිරීම මෙහි අරමුණ වේ.



**ජලය රඳවාතබා ගැනීමට හැකි ලෙස උඩවැඩියා ඒකකයේ වැන්ඩා පැළ ගෘහය වැඩිදියුණු කිරීම සඳහා පොළව සකස් කිරීම සිදු කර ඇති අයුරු**

- මල්වගා ක්ෂේත්‍රය හා ශාක සම්බන්ධ තොරතුරු කොළඹ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කරන ලද නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ දී මල්වගා ක්ෂේත්‍රය, ශාක සම්බන්ධ උපදේශන කටයුතු සිදුකිරීම, පුහුණු පන්ති පැවැත්වීම වැනි මල්වගා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කරන ලදී.

- මල්වගා සංවර්ධන අංශයෙහි පවත්වා ගෙන යන පර්යේෂණාගාර, පරීක්ෂණාගාර සඳහා වැයවන විදුලිය අධික බැවින් සූර්ය බල කෝෂ පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

- මල්වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුව මෙම වසරේ නොවැම්බර් 09 වැනිදා පවත්වන ලද අතර මෙහිදී මල්වගා ක්ෂේත්‍රයේ පවතින ගැටළු පිළිබඳ, සංවර්ධනය උදෙසා වන පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. මෙයට සමගාමීව ජාතික මට්ටමේ මල් ප්‍රදර්ශනයක් දිවයින පුරා විසිරී ඇති සුළු හා මධ්‍ය පරිමාණ මල් වගාකරුවන් වන සුවහස් මල් සංගම්වල එකමුතුවෙන් නොවැම්බර් 09-11 දක්වා දිනයන් වල බත්තරමුල්ල දියත උයන පරිශ්‍රයේදී පවත්වන ලදී. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය කරමින් සුවහස්මල් සමිති සාමාජිකයින් මෙයට සහභාගී විය.

## 5.7. අධ්‍යාපනය සහ පුහුණුව

අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන වෙන් කිරීම් වලින් රු. මි. 0.5 ක්

උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 1.125

2018 වැය **:-** රු.මි. 1.574

පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කරන ලද අතර අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.



**ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන් පිරිසක් ප්‍රායෝගික පුහුණුව ලබමින්**

- තරුණයින් 47 දෙනෙකු නවීන මල් වගා ක්‍රමවේද, භූ අලංකරණ ක්‍රම වේද පිලිබඳව ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව හරහා පුහුණු කරන ලදී.
- භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර 4 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරයි.
- රෝස වගාව, තවාන් කළමනාකරණය, ශාක හදුනාගැනීම, ශාක ශල්‍යකර්මයන්, මල් සැකසුම්, පශ්චාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 14,142 ක් පුහුණු කරන ලදී. මීට අමතරව ජෛව විවිධත්වය හා එහි සංරක්ෂණය පිළිබඳ පාසල් සිසුන් ඇතුළුව පුද්ගලයින් 30 ක් ද දැනුවත් කරන ලදී.



**දෙපාර්තමේන්තු අලුතින් බඳවා ගත් සේවකයින්ගේ ධාරිතා වර්ධනය සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහනක්**

- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලද අතර අවශ්‍ය අවස්ථා වලදී දෙපාර්තමේන්තුවට පරිබාහිර ස්ථාන වලදී දේශීය හා විදේශීය පුහුණුව දීමට ද කටයුතු කරන ලදී.

## 5.8. මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය

| |
|---|
| අනුමත ප්‍රතිපාදන:- ප්‍රාග්ධන වෙන් කිරීම් වලින් රුපියල් මිලියන 7.50 |
| 2018 වැය (අතැති බිල්පත් සමග) :-රු. මි. 7.488 |

- ක්ෂේත්‍ර කාර්යාල ගොඩනැගිල්ල අංක. 05 හි අළුත්වැඩියා කටයුතු සිදුකිරීම සිදු කෙරුණු අතර එහි කටයුතු නිම කරන ලදී.
- පැළ ප්‍රචාරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර පැළ 38,320 ප්‍රමාණයක් නිපදවන ලදී.
- සෙවණ ගෘහයක් සහ පැළ අලෙවි සැලක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.
- මීට අමතරව ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර, කාර්යාලීය ලී බඩු හා වෙනත් අවශ්‍ය මෙවලම් මිලදී ගන්නා ලදී.
- නිෂ්පාදනය කරනු ලබන පැළ නිසි ලෙස නඩත්තු කිරීම සඳහා අවශ්‍ය ජල පහසුකම් පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. පුහුණු වීමට පැමිණෙන පුද්ගලයින් සඳහා ආසන පහසුකම් සැපයීමේ අරමුණින් (උද්‍යාන බංකු කිහිපයක්) ස්ථාපිත කරන ලදී.
- මධ්‍යස්ථාන පරිශ්‍රයට හා වගාවන්ට වන සතුන්ගෙන් වන උවදුරු අවම කිරීම සඳහා විදුලි වැටක් ඉදිකිරීමේ කටයුතු කර අවසන් කරන ලදී.

## 5.9. මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට

අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන වෙන් කිරීම් වලින් රු.මි. 65.370

උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් 1.250

2018 වැය (අතැති බිල්පත් සමග) : රු.මි. 66.547

උද්භිද උද්‍යානයේ යටිතල හා මහජන පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම වසරේදී ද සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.



අලුතින් ඉදිවූ නිල නිවාස 04 ක් සහිත නිවාස සංකීර්ණය

- දැනට පවතින කාර්ය මණ්ඩල නිල නිවාස 03 ට අමතරව අලුතින් නිල නිවාස 04 ක් සහිත නිවාස සංකීර්ණයක ඉදිකිරීම් කටයුතු කර ඇත.



උද්‍යානයේ එක්රැස් වන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අළුතින් ඉදිවූ ඒකකය

- උද්‍යානයේ මල්වගා අංශය සඳහා අවශ්‍ය වී තිබූ සේවකයින් සඳහා වන ගොඩනැගිල්ලක සහ ගබඩාවක ඉදිකිරීම් කටයුතු වල පළමු අදියර සිදුකර අවසන් වී ඇත.
- උද්‍යානයේ සහ ප්‍රදේශයේ මල්වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් පසුගිය වසරේදී ආරම්භ කර පළමු අදියරයෙහි වැඩ අවසන් කරන ලද මල්වගා ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වල දෙවන අදියරෙහි ඉදිකිරීම් කටයුතු මෙම වසරේදී අවසන් කරන ලදී.
- උද්‍යානයේ මව් ශාක එකතුව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පැළ වර්ග මිලදී ගත් අතර සජීවී ශාක එකතුව වැඩිදියුණු කරන ලදී.

- උද්‍යානයේ එක්රැස් වන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය වන ඒකකයක ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී.

- උද්‍යානයේ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා කාපට් ඇතිරීම සිදු කරන ලද අතර අපජලය කළමනාකරණය සඳහා පල්දෝරු වලක්ද ඉදිකරන ලදී.

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංශ වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී. ළමුන් සඳහා අධ්‍යාපනික වශයෙන් වැදගත් වන ළමා උද්‍යානයක් පිහිටුවීම සඳහාද අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගන්නා ලදී.



**උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරමින් පවතින අයුරු**

- ප්‍රදේශයේ මල් වගාකරුවන් හට පහසුකම් සැපයීම සඳහා උද්‍යානයේ මල්වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කර ඇත. උද්‍යානයේ සජීවී ශාක එකතුවද වැඩිදියුණු කර ඇති අතර ප්‍රදේශයේ මල් වගාකරුවන් දිරිගැන්වීම සහ එම ප්‍රමාණය වර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, වැඩමුළු හා පුහුණු සැසි ද පවත්වන ලදී.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර පැළ 23,544 ප්‍රමාණයක් නිපදවන ලදී.

- නව කාර්යාලයක්, කුඩා ශාකාගාරයක්, සාකච්ඡා කාමරයක්, පුස්තකාලයක් සමඟ නරඹන්නන් සඳහා මධ්‍යස්ථානයක් දකුණු දොරටුව අසල ඉදිකිරීමේ දෙවන අදියරෙහි කටයුතු ආරම්භ කරන ලද අතර එහි වැඩ කටයුතු දැනට අවසන් කර ඇත.

- උද්‍යානයට අවශ්‍ය විස්තරාත්මක නාමපුවරු හා මාර්ගෝපදේශ සපයන පුවරු සහ උපදෙස් පුවරු සවි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා සැලසිනේ ආයතනය වෙත භාර දී ඇති අතර කටයුතු සිදුවෙමින් පවතී.

- උද්‍යානය වටා ඇති ආරක්ෂිත වැටෙහිද ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.

## 5.10. සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

| |
|---|
| අනුමත ප්‍රතිපාදන : ප්‍රාග්ධන වෙන් කිරීම් වලින් රු. මි. 29.090 ක් සහ උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි.4.150 |
| 2018 වැය (අතැති බිල්පත් සමග) : රු.මි. 32.868 |

උද්‍යානයේ නරඹන්නන් සඳහා පහසුකම් උද්‍යානය තුළ ඇතිකිරීම, නඩත්තු කටයුතු ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සහ උද්‍යානය තුළ නව පහසුකම් ඇතිකිරීම සඳහා විවිධ සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

- උද්‍යානයට පැමිණෙන නරඹන්නන්ට පානීය ජල පහසුකම් සැපයීමේ අරමුණින් ජල ටැංකියක් ස්ථාපිත කල අතර පානීය ජල සැපයුමක් ස්ථාපිත කිරීමේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමග එක්ව සිදු කරන ලදී.



**රෝස උද්‍යානය වටා ස්ථාපිත ආරක්ෂිත වැට**

- උද්‍යානය වටා ආරක්ෂිත වැටෙහි කොටසක් ස්ථාපනය කිරීම් කටයුතු සිදුකර නිම කර ඇත.

- පැළ තවාන සඳහා සෙවණ ගෘහයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර එහි වැඩ කටයුතු අවසන් කර ඇත. මෙහි නඩත්තු කටයුතු සඳහා නවීන තාක්ෂණික උපක්‍රම භාවිතා කිරීමට සැලසුම් කර ඇත.මෙය ඉදිරියේදී මල්වගා අධ්‍යයන කටයුතු , පුහුණු කිරීම් කටයුතු සඳහා යොදා ගැනීමටද බලාපොරොත්තු වේ.



**උද්‍යානයේ සිදු කරන ලද ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු**

- මල්වගා තවාන් පවතින ප්‍රදේශයේ මාර්ගවල සංවර්ධන කටයුතු සිදුකෙරුණු අතර උද්‍යාන බංකු ස්ථාපිත කිරීම් කටයුතුද සිදුකරන ලදී.

- ගරාජයක් ගබඩාවක් සහිත ක්ෂේත්‍ර කාර්යාලයක් ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

- උද්‍යානයේ ආරක්ෂාව සඳහා මුරකුටියක් ඉදිකරන ලදී.

- උද්‍යානයේ මල්වගා කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් ඇන්තූරියම් හා ඕකිඩ් පැළ තවාන සහිත සෙවණ ගෘහ සඳහා නවීන තාක්ෂණික ජල සැපයුම් පද්ධති ස්ථාපිත කරන ලදී.



ඉදිකරමින් පවතින ගරාජයක් ගබඩාවක් සහිත ක්ෂේත්‍ර කාර්යාලය

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩිදියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංශ වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.

- මෙහිදී පර්ණාංග ශාක කොටස, ජපන් උද්‍යානය, රෝස උද්‍යානය සහ තාල වර්ගයේ ශාක එකතුවෙහි සංවර්ධන කටයුතු සිදු කෙරුණි.



පැළ තවාන සඳහා සෙවණ ගෘහයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර එහි වැඩ කටයුතු සිදුකරමින් පවතින අයුරු

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර පැළ 47,322 ක ප්‍රමාණයක් නිපදවන ලදී.

සියලු උද්‍යානයන් හි කාර්යක්ෂම කළමනාකරණය සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදීගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුළින් උද්‍යානවල තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

ඉහත සඳහන් සංවර්ධන වැඩසටහන් වලට අමතරව දෙපාර්තමේන්තුව විසින් මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමලයේ පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක, අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01, නුවර, නුවරඑළිය සහ අනුරාධපුර නිල නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ අරලියගහ මැදුර නිල නිවාස උද්‍යානය සහ නුවරඑළිය නිල නිවාස උද්‍යානය ද අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්ත්වය මනා ලෙස පවත්වාගෙන යාමේ කටයුතු ද සිදු කරනු ලැබීය.

උද්‍යාන භාරකාර අරමුදලේ මූල්‍යමය සහාය යටතේ 2018 වර්ෂයේදී ද උද්‍යානවල සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලද අතර එය උද්‍යානවල තත්ත්වය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට විශාල දායකත්වයක් සපයන ලදී .

2018 වර්ෂය සඳහා උද්‍යානභාරකාර අරමුදලේ වාර්ෂික ප්‍රාග්ධන වෙන්කිරීම් රුපියල් මිලියන 175 ක් වූ අතර එයින් රුපියල් මිලියන 174.535 (99.7%) වැය කර උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

## 6. 2018 වර්ෂය තුල තනතුරු ඇති කිරීම්, බඳවා ගැනීම්, ස්ථාන මාරු, මුදා හැරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යාම්

### 6.1 තනතුරු ඇතිකිරීම්

| තනතුර | 2018 වසරේ අනුමත තනතුරු සංඛ්‍යාව | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| තාවකාලික උද්‍යාන කම්කරු | 50 | 50 |
| නඩත්තු සහායක (කොන්ත්‍රාත්) | 50 | 50 |

### 6.2 බඳවා ගැනීම්

| තනතුර | 2018.01.01 පුරප්පාඩු | 2018 බඳවා ගැනීම් |
|---|---|---|
| කාර්මික නිලධාරී | 01 | 01 |
| ශාස්තු අයකිරීමේ සහකාර | 05 | 03 |
| ආරක්ෂක නියාමක | 12 | 08 |
| තවාන්කරු | 01 | 01 |
| උද්‍යාන කම්කරු | 151 | 134 |
| එකතුව | | 147 |

## 6.3 ස්ථාන මාරු

| තනතුර | දෙපාර්තමේන්තුවට පැමිණි සංඛ්‍යාව | දෙපාර්තමේන්තුවෙන් පිටතට ගිය සංඛ්‍යාව |
|---|---|---|
| සංවර්ධන නිලධාරී | 01 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 10 | 07 |
| රියදුරු | 05 | 03 |
| **එකතුව** | **16** | **10** |

## 6.4 මුදා හැරීම්, ඉල්ලා අස්වීම් සහ සේවය අතහැර යාම්

| තනතුර | මුදා හැරීම් | ඉල්ලා අස්වීම් | සේවය අතහැර යාම් |
|---|---|---|---|
| අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ ප්‍රචාරණ) | 01 | | |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | 01 | | |
| ගාස්තු අයකිරීමේ සහකාර | | 04 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 03 | | |
| බද්ධකරු | | 02 | |
| උද්‍යාන කම්කරු | **03** | 02 | |
| **එකතුව** | **08** | **08** | **01** |

## 6.5 අන්තර්ග්‍රහණය කිරීම්

වැඩසටහන් සහකාර(පර්යේෂණ හා සංවර්ධන සහකාර) ලෙස සේවය කළ එම්.ජී ෆෝන්සේකා මිය සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර ඇත.

## 6.6 විශ්‍රාම ගැනීම් සහ මිය යාම්

| තනතුර | විශ්‍රාම ගැනීම් | මිය යාම් |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | - |
| පර්යේෂණ සහකාර (විශේෂ) | 01 | - |
| උද්‍යාන සංවර්ධන සහකාර/ කෘෂි උපදේශක | 03 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 | 01 |
| රියදුරු | 04 | - |
| කාර්යාල කාර්ය සහායක | 01 | - |
| බද්ධකරු | 01 | - |
| තවාන්කරු | 01 | - |
| උද්‍යාන කම්කරු | 05 | - |
| **එකතුව** | **19** | **02** |

## 7. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල තොරතුරු.

### 7.1 දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | එස්.ඒ ක්‍රිෂ්ණරාජා මෙනවිය |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | එච්.සි.පි ජයවීර මිය |
| අධ්‍යක්ෂ (පාලන) | වයි.එම්.වයි යාපා බණ්ඩාර මයා |
| ප්‍රධාන ගණකාධිකාරී | ඩබ්.ටී.යූ. ද මෙල් මයා |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | එන්.ටී ලියනගේ මිය |
| ගණකාධිකාරී | ඩී.එම් වීරසේකර මයා |
| ඉංජිනේරු (සිවිල්) | ඒ.එල්.එම් මාහිර් මයා |
| සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | එච්.ජී ජයසේකර මයා |

### 7.2 දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ තෘතීය කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| පරිපාලන නිලධාරි | එච්.ආර්.එම්.ඒ.එම් රත්නායක මිය |
| රජයේ භාෂා පරිවර්තක | ඩී.ජී.වලිසිංහ මිය |
| රජයේ භාෂා පරිවර්තක | බී.තාරික් අලී මයා |

### 7.3 දෙපාර්තමේන්තු උප කාර්යාල වල ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ - රාජකීය උද්භිද උද්‍යානය | ආචාර්ය ඒ.එම්.ඒ.එස් අත්තනායක මිය |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ - මල්වගා පර්යේෂණ අංශය | එම්.එම්.ඩී.ජේ සේනාරත්න මයා |
| සහකාර අධ්‍යක්ෂ - ගම්පහ උද්භිද උද්‍යානය | එම්.සී වික්‍රමසිංහ මිය |
| සහකාර අධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ කාර්යාලය, නාරාහේන්පිට | ආර්.එස්.ඩබ් ගෝමස් මිය |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ - ජාතික ශාකාගාරය | ආචාර්ය ආර්.ඒ.එස්.ඩබ් රණසිංහ මිය |
| සහකාර අධ්‍යක්ෂ - සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය | පි.ඩී.එස් විජේරත්න මයා |

## 8. කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියාව ගොඩනැංවීම

### 8.1. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් (විදේශීය)

| | වැඩසටහන | රට | කාල සීමාව | විදේශගත වූ නිලධාරීන්ගේ තනතුරු | නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | International Programme on Management Auditing for the Public Sector Internal Auditors | මැලේසියාව | 2018.01.17 සිට 2018.01.23 දක්වා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 |
| 2. | Landscape Gardening, Management and Nursery Management | සිංගප්පූරුව | 2018.04.13 සිට 2018.04.29 දක්වා | උද්‍යාන සංවර්ධන සහකාර | 02 |
| 3. | Environmental Management of Nature Parks on Reserves | ඊශ්‍රායලය | 2018.06.10 සිට 2018.06.29 දක්වා | අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 |
| 4. | Leadership Development for Research Managers Training Course | තායිලන්තය | 2018.05.30 සිට 2018.06.10 දක්වා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මල්වගා) | 01 |
| 5. | Seminar on Import and Export Management and Protection of Endangered Species for Developing Countries | චීනය | 2018.06.25 සිට 2018.07.15 දක්වා | වැඩසටහන් සහකාර සංවර්ධන නිළධාරී කෘෂි මෙහෙයුම් නිලධාරි | 11 |
| 6. | Training Programme in Indian Public Sector | ඉන්දියාව | 2018.07.30 සිට 2018.08.03 දක්වා | සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) සහකාර අධ්‍යක්ෂ (පාලන) | 03 |
| 7. | International Programme on Management | තායිලන්තය | 2018.11.25 සිට 2018.12.02 දක්වා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| 8. | International programme on “Enterprise project and Organanization Management” in Thailand | තායිලන්තය | 2018.11.04 සිට 2018.11.10 | ප්‍රධාන ගණකාධිකාරී ප්‍රධාන අභ්‍යන්තර විගණක | 02 |
| 9. | IABG Training Programme | චීනය | 2018.08.26 සිට 2018.09.16 | සහකාර අධ්‍යක්ෂ | 21 |

## 8.2 කාර්ය මණ්ඩල නිලධාරීන් බාහිර ආයතන වෙතින් ලද පුහුණු (දේශීය)

| අනු අංකය | පුහුණුව පැවැත්වූ දින | පුහුණු පාඨමාලාවේ නම | පුහුණුව පැවැති ස්ථානය | සහභාගිවූ නිලධාරින් |
|---|---|---|---|---|
| 01 | 2018.02.22<br>2018.02.23 | විදුලි ජනක යන්ත්‍ර භාවිතය හා නඩත්තුව පිළිබඳව | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | අයි.ජී.සුසන්ත සමරනාථ මයා |
| 02. | 2018.03.08<br>2018.03.09 | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි. | නිපුණතා පියස | බී.එම්.අමිතා කුමාරි මිය |
| 03 | 2018.03.28<br>2018.03.29 | ව්‍යාපෘති කලමනාකරණය පිළිබද. | ශ්‍රී ලංකා පදනම් ආයතනය | එච්.සී.පී.ජයවීර මිය<br>එච්.ජී.ජයසේකර මයා<br>එම්.මලවරආරච්චි මිය |
| 04 | 2018.03.27<br>2018.03.28 | විදුලි යන්ත්‍ර භාවිතය හා නඩත්තුව | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු ආයතනය | අයි.ජී.සුසන්ත සමරනාථ මයා |
| 05 | 2018.06.28<br>2018.06.29 | ව්‍යාපෘති නියාමනය හා ඇගයීම් පිළිබඳ | ශ්‍රී ලංකා පදනම් ආයතනය | එච්.ජී.ජයසේකර මයා<br>එම්.මලවරආරච්චි මිය |
| 06 | 2018.07.23<br>2018.07.24 | මුදල් රෙගුලාසි 104 අලාභ වාර්තා කිරීම හානි පූර්ණය හා ගිණුම් තැබීම | නිපුණතා පියස | වයි.එම්.වයි.යාපා බණ්ඩාර මයා.<br>ඩී.එල්.චිත්‍රා රෝහිණී මිය<br>පී.යූ.ගමගේ මිය.<br>එස්.කේ වික්‍රමසිංහ මිය.<br>භාග්‍යා ප්‍රබෝදනී සම්පත් මිය. |
| 07 | 2018.07.26 | ගිණුම් ලිපිකරුවන්ගේ කාර්ය භාරය හා වගකීම් | නිපුණතා පියස | ප්‍රියන්තා අතාවුද මිය.<br>ඩී.යූ.එස්.එස්.අමරදාස මිය. |
| 08 | 2018.07.30<br>2018.07.31 | ප්‍රසම්පාදන සැලසුම් කිරීම හා ලංසු ලියකියවිලි සකස් කිරීම. | නිපුණතා පියස | පී.බී.ඩබ්.එම්.පී.කේ.ඇහැලගොල්ල මිය.<br>ඒ.සී.ආර්.රොෂාන් මිය. |
| 09 | 2018.08.03 | වාහන කළමනාකරනය පිළිබදව. | නිපුණතා පියස | එම්.බී.ජුනයිඩීන් මයා. |
| 10 | 2018.08.09<br>2018.08.10 | මනා සංවිධානය සැලසුම් ජාල හා ගබඩා කලමනාකරණය. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | කේ.ඒ.ඩී.යූ.ආරියසිංහ මයා.<br>ශාන්ත ජයරත්න මයා. |
| 11 | 2018.08.14 | නවබදු නීතිය Payawirhholdinhs& capital gains | PRAG SERVICS(PVT)LTD | ඩබ්.ටී.යු ද මැල් මයා.<br>ඩී.එම්.වීරසේකර මයා.<br>එස්.කේ.වික්‍රමසිංහ මිය.<br>අයි.ටී. ප්‍රේමසිංහ මිය.<br>එන්.ටී.ප්‍රේමතිලක මිය.<br>එම්.එල්.එදිරිවික්‍රමසූරිය මිය. |
| 12 | 2018.09.20<br>2018.09.21 | වැටුප් පරිවර්තන - වැඩමුළුව | නිපුණතා පියස | එස්.කේ.වික්‍රමසිංහමිය.<br>අයි.ටී. ප්‍රේමසිංහමිය.<br>එස්.ඒ.එල්.සමරවීර මයා<br>ඒ.එම්.එන්.කුමාරි මිය<br>කේ.ජී.එස්.ශානිකා මිය<br>ඩී.ජී.ලාලනි මෙනවිය |

## 09. 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරකම් සැලැස්ම

| වැඩසටහන්/ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| **පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යාන සංවර්ධන වැඩසටහන** | | |
| ගොඩනැගිලි, නිලනිවාස, යන්ත්‍රෝපකරණ සහ වාහන අළුත්වැඩියා කටයුතු | 18.5 | ඒකාබද්ධ අරමුදල්/ උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 7 | ඒකාබද්ධ අරමුදල් |
| අපද්‍රව්‍ය කළමණාකරන වැඩසටහන | 1 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක එකතුන් වැඩිදියුණු කිරීම සහ විතැන් සංරක්ෂණ කටයුතු | 1 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| උද්භිද උද්‍යාන කෞතුකාගාරය සහ තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම. | 24 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| කෞතුකාගාරය හා තොරතුරු මධ්‍යස්ථානයේ අභ්‍යන්තර සැලසුම් නිර්මාණය කිරීම | 3 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පැළ තවාන අසල ගං ඉවුර සංරක්ෂණය | 6.5 | ඒකාබද්ධ අරමුදල් |
| කුළුබඩු උද්‍යානයේ නවීන අංගෝපාංග සහිත වැසිකිළි පද්ධතියක් ස්ථාපිත කිරීම | 8 | ඒකාබද්ධ අරමුදල් |
| මාං ඔය ජල සැපයුම පුනරුත්තාපනය කිරීම | 1.8 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| වනෝද්‍යානයේ ආරක්ෂිත වැට ඉදිකිරීම | 1.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ශාක ලේබල්, විස්තරාත්මක පුවරු සහ දර්ශන පුවරු සවි කිරීම සහ අධ්‍යාපනික වැඩසටහන්, තොරතුරු පත්‍රිකා මුද්‍රණය | 1.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ඉඩම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කටයුතු | 5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ස්ටෝරුව නැවත ස්ථාපිත කිරීම | 8 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| මාර්ගය දෙපස වර්ණවත් ගල් ඇතිරීම | 1.2 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| එළිමහන් පැළ තවාන වැඩිදියුණු කිරීම | 3 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **91** | |
| **හක්ගල උද්භිද උද්‍යාන සංවර්ධන වැඩසටහන** | | |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම | 2 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ශාක එකතුන් වැඩිදියුණු කිරීම හා ශාක සංරක්ෂණ කටයුතු | 0.4 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ඉඩම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කටයුතු | 7.8 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| රථගාල සංවර්ධනය | 12 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| චේන් ලින්ක් වැට ඉදිකිරීම | 4.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, වාහන අලුත්වැඩියාව | 1 | ඒකාබද්ධ අරමුදල් |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනිම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| නව වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම | 3.5 | ඒකාබද්ධ අරමුදල් |
| කැෆටේරියා සහ සම්පත් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම | 3 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |

| වැඩසටහන්/ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| (අදියර 1 ) | | |
| ජලපවාහන පද්ධතිය සංවර්ධනය | 3 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ස්ටෝරුව ස්ථාපිත කිරීම (අදියර 2 ) | 11 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පැළ වීදුරු ගෘහය ස්ථාපිත කිරීම | 7 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ඖෂධ පැළෑටි උද්‍යාන සහ සුවඳවත් පැළෑටි උද්‍යාන සංවර්ධනය | 1 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පාසි ශාක උද්‍යාන සංවර්ධනය | 0.3 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පැළ අලෙවි සැල වැඩිදියුණු කිරීම | 0.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **58** | |
| **ගම්පහ උද්භිද උද්‍යාන සංවර්ධන වැඩසටහන** | | |
| නව ආම්පන්න,කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අළුත්වැඩියාව | 1.3 | ඒකාබද්ධ අරමුදල් |
| උද්‍යානය වටා ආරක්ෂිත බැම්ම වැඩිදියුණු කිරීම | 2.5 | ඒකාබද්ධ අරමුදල් |
| උද්‍යානයේ විද්‍යුත් විදුලි සංදේශ හා ජල සැපයුම් පද්ධති පුනරුත්ථාපනය කිරීම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක එකතුන් වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණ කටයුතු | 1 | ඒකාබද්ධ අරමුදල් |
| ප්‍රවේශ පත්‍ර කවුළුව හා ආරක්ෂිත කුටි නවීකරණය | 10 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම පුවරු, දර්ශන පුවරු සවි කිරීම, ප්‍රකාශන | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩිදියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සිදු කිරීම | 5 | ඒකාබද්ධ අරමුදල් |
| අත්තනගලු ඔය උද්‍යානයට යාබද ඉවුරු සංරක්ෂණය | 7.5 | ඒකාබද්ධ අරමුදල් |
| යකඩ වැටක් ස්ථාපිත කිරීම | 4 | ඒකාබද්ධ අරමුදල් |
| ප්‍රදර්ශන ප්‍රදේශයක් නිර්මාණය කිරීම | 1 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **34.3** | |
| **මල්වගා සංවර්ධන වැඩසටහන** | | |
| පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සහ මල්වගා සංවර්ධන අංශයේ පර්යේෂණාගාරයේ විවිධ නඩත්තු කටයුතු | 7.0 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගා සම්බන්ධ අත් පත්‍රිකා, පුවත්පත් ප්‍රකාශයට පත් කිරීම | 1.0 | ඒකාබද්ධ අරමුදල් |
| මල් ප්‍රදර්ශන/ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම | 2.0 | ඒකාබද්ධ අරමුදල් |
| රෝපණ ද්‍රව්‍ය සැපයීම මඟින් වගාකරුවන්ට සහාය ලබා දීම | 18.0 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ තවාන් සහ වැවිලි ප්‍රදේශ දියුණු කිරීම | 8.1 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ විකිණීම සහ සිටුවීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම | 4.0 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගා කරුවන් සඳහා පුහුණු සැසි,වැඩමුළු,සම්මන්ත්‍රණ, සමුළු, ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම | 6. | ඒකාබද්ධ අරමුදල් |
| මව් ශාක මිලදී ගැනීම | 3 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **49.1** | |
| **ගනේවත්ත වන ඖෂධ උයන සංවර්ධන වැඩසටහන** | | |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අළුත්වැඩියාව | 1.1 | ඒකාබද්ධ අරමුදල් |

| වැඩසටහන්/ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| ශාක එකතුන් වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණ කටයුතු | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම පුවරු, විස්තරාත්මක පුවරු සවි කිරීම | 0.1 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩිදියුණුකිරීම් කටයුතු සහ වෙනත් නඩත්තු කටයුතු | 5 | ඒකාබද්ධ අරමුදල් |
| වගාකටයුතු සඳහා ජල සම්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම | 3.7 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **10.4** | |
| **මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධන වැඩසටහන** | | |
| කාර්යාලීය උපකරණ, යන්ත්‍රෝපකරණ හා අනෙකුත් ආම්පන්න මිලදී ගැනීම හා අළුත්වැඩියාව | 5.45 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගා අංශය තුළ සේවක පහසුකම් සහිත ගොඩනැගිල්ලක් සහ ගබඩාවක් ස්ථාපිත කිරීම (අදියරii) | 4.5 | ඒකාබද්ධ අරමුදල් |
| මාර්ග සංවර්ධනය | 4.4 | ඒකාබද්ධ අරමුදල් |
| උද්භිද උද්‍යානය තුළ ළමුන් සඳහා අංශයක් ස්ථාපිත කිරීම | 2 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක එකතුන් වැඩිදියුණු කිරීම හා සංරක්ෂණ කටයුතු | 2 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම පුවරු, ප්‍රදර්ශන පුවරු හා සවිස්තරාත්මක පුවරු සවිකිරීම | 3 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කටයුතු | 5.9 | ඒකාබද්ධ අරමුදල් |
| පර්යේෂණ හා සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීම | 33 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| අතිරේක ජල සැපයුම් ටැංකි ස්ථාපනය කිරීම | 3.5 | ඒකාබද්ධ අරමුදල් |
| බැටරි බලයෙන් ධාවනය වන බස් රථයක් මිලදී ගැනීම | 4 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **67.75** | |
| **සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධන වැඩසටහන** | | |
| කාර්යාලීය උපකරණ, යන්ත්‍රෝපකරණ හා අනෙකුත් ආම්පන්න මිලදී ගැනීම හා ගොඩනැගිලි වල තීන්ත ආලේප කිරීම | 2.85 | ඒකාබද්ධ අරමුදල් |
| කාර්යාලීය ගොඩනැගිල්ලක් ස්ථාපිත කිරීම | 35 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| සේවකයින් සඳහා ක්ෂේත්‍ර කාර්යාලඅ 02 ක් සහ විවේකාගාරයක් ඉදිකිරීම | 3 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ අලෙවි කරනු ලබන ප්‍රදේශය වැඩිදියුණු කිරීම | 5 | ඒකාබද්ධ අරමුදල් |
| නිල නිවාස නවීකරණය | 1.0 | ඒකාබද්ධ අරමුදල් |
| විවිධ අංශවලට එක්වන දොරටු සඳහා ගේට්ටු තුනක් හා ආරක්ෂිත වැට කොටසක් ස්ථාපිත කිරීම | 5 | ඒකාබද්ධ අරමුදල් |
| මව්ශාක එකතුවක් ස්ථාපනය | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| සූර්ය බලශක්ති කෝෂ පද්ධති ස්ථාපනය | 1 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම පුවරු විස්තරාත්මක හා ප්‍රදර්ශන පුවරු සවිකිරීම | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| ගිම්හාන කුටි ඉදිකිරීම | 2 | ඒකාබද්ධ අරමුදල් |
| බැටරි බලයෙන් ධාවනය වන කාර් මිලදී ගැනීම | 3 | ඒකාබද්ධ අරමුදල් |
| මල අපද්‍රව්‍ය පිරිපහදුව සඳහා ටැංකි දෙකක් ස්ථාපනය කිරීම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩිදියුණුව හා නඩත්තු කටයුතු | 4.3 | ඒකාබද්ධ අරමුදල් |
| මාර්ග සංවර්ධනය | 4.5 | ඒකාබද්ධ අරමුදල් |

| වැඩසටහන්/ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රුපියල් මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| දැනට පවතින පැරණි ගොඩනැගිලි නිල නිවාස බවට සංවර්ධනය කිරීම | 4 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **73.15** | |
| **මීගලෑව සංවර්ධන වැඩසටහන** | | |
| පරිශ්‍රය වටා ජලපවහන පද්ධති වැඩිදියුණු කිරීම | 1 | ඒකාබද්ධ අරමුදල් |
| පැරණි ගොඩනැගිල්ල ඉදිකිරීම | 1 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කටයුතු | 1 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **3** | |
| **ජාතික ශාකාගාරය සංවර්ධන වැඩසටහන** | | |
| ශාක ගවේෂණ වැඩසටහන හා ශාක අධ්‍යන කටයුතු | 2.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ශාකාගාර නඩත්තු කටයුතු | 2 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ප්‍රකාශණ සැකසීම හා මුද්‍රණය හා ග්‍රන්ථ මිලදී ගැනීම | 2 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| වැඩමුළු හා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම | 1.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පරීක්ෂණාගාර වැඩිදියුණු කිරීම සහ අනෙකුත් විද්‍යාත්මක සේවාවන් දත්ත පද්ධතීන් යාවත්කාලීන කිරීම | 7.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ජීව අණුක විද්‍යාත්මක පර්යේෂණාගාරය සැලසුම් කිරීම හා ඒ සඳහා උපදේශන ලබා ගැනීම | 7 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ජාතික ශාකාගාරයේ ගොඩනැගිල්ලෙහි අළුත්වැඩියා කටයුතු | 10 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **31.5** | |
| **පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු වැඩසටහන** | | |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා නඩත්තු කටයුතු | 1.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන්වලට සහභාගී කරවීම (දේශීය/විදේශීය) | 1.0 | ඒකාබද්ධ හා උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **2.5** | |
| **ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු හා උද්භිද උද්‍යානයන් හි අලංකරණ හා ප්‍රවර්ධන කටයුතු** | | |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් | 3.5 | ඒකාබද්ධ හා උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ප්‍රවර්ධන කටයුතු හා උද්භිද අලංකරණ කටයුතු | 6.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **10** | |
| ගාල්ල උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු | 01 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **මුලු එකතුව** | **431.7** | |